**පාඩම 11**

**ක්‍රියාකාරකම 1**

**දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

රුකඩ කපන්නාගේ කම්මල වූ කලි කාමරයකින් ද ඉස්තෝප්පුවකින් ද යුතු, මැටි ගසා අතු සෙවෙණි කළ පැල්පතකි. කපා නිම කළ, නොකළ රුකඩින් ද, සායම් ගා වේළීමට තැබූ විචිත්‍ර වර්ණයෙන් ද බබළන රුකඩින් ද, නියන්, කැති, පිහියා, කෙටේරි, සායම් ටින්, බුරුසු, සතුන්ගේ ඇට කටු, දත්, නිය, ඔලිඳ ඇට යන ආදියෙන් ද පිරි ඔහුගේ කම්මලෙහි ඇතුළු කාමරය වූ කලි නියම කටු ගෙයක් විය. ඉස්තෝප්පුවේ කොනක වූ වතුර සැළියක් ගත් ලිග්ගල් තුනකින් යුතු උදුනෙන් දුම් නොනඟින්නේ දවල් දොළහේ සිට එක දෙක වන තෙක් පමණි. එතැන් සිට රෑ හත වන තුරු උදුනෙන් නගින ගින්න නො නිවේ. වතුර හැළිය උපකාර වූයේ ඔහුගේ රුකඩ කැපීමට නොව ඔහු රුකඩ කැපීමෙන් එකතු කරගත් සුළු මුදලට තවත් සත කිහිපයක් ලබාදීමෙන් ඔහුගේ ආදායම වැඩි කිරීමට ය.

රුකඩ කපන්නාගේ ඉස්තෝප්පුව කෝපි කඩයකි.

අපේ ගම

මාර්ටින් වික්‍රමසිංහ

01.ඡේදයෙන් කියවෙන්නේ කුමන ස්ථානයක් ගැන ද? ..........................................

02.ඉස්තෝප්පුවේ කොනක ඇත්තේ කුමක් ද? ...................................................

**ක්‍රියාකාරකම 2**

**ඡේදයට අනුව සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

01.රුකඩ කපන්නාගේ කම්මල ............................................. (උළු සෙවෙණි කළ නිවසකි./ අතු සෙවෙණි කළ පැල්පතකි./ පිදුරු සෙවෙණි කළ පැල්පතකි.)

02.රුකඩ කපන්නාගේ නිවසේ ඇතුළු කාමරය......................(සිරගෙයක් බඳු ය./ කටුගෙයක් බඳු ය. / බිංගෙයක් බඳු ය.)

03.ඉස්තෝප්පුවේ කොනක වූයේ................................................. (කොස්සකි./ මල් පෝච්චියකි./උදුනකි.)

04.රුකඩ කපන්නාගේ ඉස්තෝප්පුව ........................................ (කම්මලකි./ පැල්පතකි./ කෝපි කඩයකි.)

05.රුකඩ කපන්නාට ආදායම් ලැබෙන ක්‍රම ................................ (එකකි./ දෙකකි./ තුනකි.)